# ප්‍රසිද්ධ වෙන්දේසියයි!

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ භාවිතයෙන් ඉවත් කරන ලද පරිගණක සහ උපාංග තොගයක් **2020.03.04 දින පෙ.ව. 10.00** ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම පරිගණක සහ උපාංග **රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලේ අපහරණ ගබඩාව තුළ ගබඩා කර ඇති අතර, ඒවා 2020.02.27 දින සිට 2020.03.03 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා** කාලය තුළ පරීක්ෂා කර බැලිය හැකිය.

03. 2020.03.04 දින පෙ.ව. 10.00 ට අදාල වෙන්දේසිය ආරම්භ කෙරෙන අතර, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මිළ නියම කිරීමේ කමිටුව මගින් එක් එක් භාණ්ඩ සඳහා නියම කර ඇති අවම මිලෙන් ලංසු තැබීම ආරම්භ වනු ඇත.

**04. කොන්දේසි:**

- වෙන්දේසියේදී නියම වන උපරිම මිළට අදාල භාණ්ඩය අලෙවි කෙරෙන අතර, ගැනුම්කරු එම අවස්ථාවේදීම නියමිත මුදල වෙන්දේසිය සිදු කරන ස්ථානයේ සිටින සරප් නිලධාරියා වෙත ගෙවා නියමිත කුවිතාන්සිය ලබා ගත යුතුය.
- භාණ්ඩය වෙන්දේසි කළ පසුව භාණ්ඩයේ වගකීම මිලදී ගනු ලබන පුද්ගලයා සතු වේ.
- **භාණ්ඩය මිලදී ගත් දින සිට දින 02ක් ඇතුලත අදාල භාණ්ඩ දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු අතර, ප්‍රමාද වන සෑම දිනක් සඳහාම දිනකට** රු. 100.00 **ක ප්‍රමාද ගාස්තුවක් අය කරනු ඇත.**
- **වෙන්දේසි භාණ්ඩ ගෙන යනු ලබන දිනයේ පමණක් තොග පාලන අංශයේ නිලධාරියෙකු අපහරණ ගබඩාවෙන් පිටතට භාණ්ඩ නිකුත් කරනු ලබන අතර, භාණ්ඩ අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරියෙකු ලවා සහතික කරවා ,එදිනම දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු වේ.**
- මෙම වෙන්දේසිය සම්බන්ධ සියළු බලතල රජයේ මුද්‍රණාලයාධිපති සතු වන අතර, රජයේ මුද්‍රණාලයාධිපති විසින් අවස්ථානුකූලව උද්ගතවන තත්වයන්හිදී ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

ගංගානි ලියනගේ

රජයේ මුද්‍රණාලයාධිපති

2020.02.26 දින

කොළඹ 08,

දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ,

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේදීය.